සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2024 | 33 S I

නම: ..........................................

# ඉතිහාසය

කාලය පැය එකයි

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති 1,2,3,4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01. මෙරට ඉතිහාසය ඉගෙන ගැනීමට උපකාරී වන පැරණිතම සාහිත්‍ය මූලාශ්‍ර ප්‍රභේදය වන්නේ,
1. අට්ඨ කථා ය 2. වංශ කථා ය
3. සංදේශ කාව්‍ය ය 4. උපදේශාත්මක ග්‍රන්ථ ය

02. දකුණු ඉන්දීය මූලාශ්‍රයක් නොවන්නේ,
1. සීලප්පදිකාරම් ය 2. පදිර්රුපත්තු ය 3. මණිමේකලායි ය 4. යාල්පාන වෛපවමාලෙයි ය

03. පහත දැක්වෙන කතුවරුන් අතරින් ඕලන්ද ජාතිකයෙකු වන්නේ කවුරුන්ද?
1. රොබට් නොක්ස් 2. පිලිප් බැල්දියස්
3. පර්නාවෝ ද ක්වේරෝස් 4. ජුවාම් රුබෙයිරෝ

04. ප්ලයිස්ටොසීන යුගයට අයත් ශිලා මෙවලම් සොයා ගෙන ඇති ප්‍රදේශයකි.
1. ඉබ්බන්කටුව 2. හල්දුම්මුල්ල 3. ගල් සොහොන් කනත්ත 4. රත්නපුරය

05. ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් නොවන්නේ මින් කුමක් ද?
1. බිම් වීදුරු මෙවලම් භාවිතය 2. මැටි ඔරු සුසාන ක්‍රමය
3. සංචාරක ජීවන රටාව 4. වාසස්ථාන ලෙස ගල්ගුහා යොදාගැනීම.

07. පහත සඳහන් ස්ථාන අතරින් පූර්ව ඓතිහාසික යුගයට අයත් ශිලා මංජුසා සොහොන් දැකගත හැකි ස්ථානය කුමක්ද ?
1. බෙරගල 2. හල්දුම් මුල්ල
3. ගල් සොහොන් කනත්ත 4. රාවණා ඇල්ල

07. අනුරාධපුරය ''නුරුපුර'' යනුවෙන් හඳුන්වා ඇති අභිලේඛනය මින් කුමක්ද ?
1. වල්ලිපුරම් රන් සන්නස 2. ගල්පොත සෙල්ලිපිය
3. වේවැල්කැටිය සෙල් ලිපිය 4. පනාකඩුව තඹ සන්නස

- පහතින් දක්වා ඇති තොරතුරු ඇසුරෙන් අංක 08 හා 09 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
A - ගංගානිම්න වලට පිටතින් ජනාවාස ආරම්භ කිරීම. B - මහ ශිලා සුසාන සම්ප්‍රදාය
C - කෘෂිකාර්මික කටයුතු වලට නැඹුරුවීම. D - කටුසර බෝග වගා කිරීම.

08. ඉහත තොරතුරු ඇසුරින් පූර්ව ඓතිහාසික යුගයට අයත් ලක්ෂණ වන්නේ
1. A හා B 2. B හා C 3. C හා D 4. A හා D

09. මුල් ඓතිහාසික යුගයට අයත් ලක්ෂණ වන්නේ,
1. A හා B 2. B හා D 3. A හා C 4. A හා D

10. පූර්ව රාජ්‍ය සමයේ රටේ නායකයා හැඳින්වීමට යොදා ගත් නාමයක් වන්නේ,
1. පොඑනි රාජ 2. තොට බොජක 3. මපරුමුකා 4. දුහතර රාජ

11. ඉන්දියාවේ මෞර්ය අධිරාජ්‍යයා සමග සබඳතා පැවැත්වූ රජතුමා තවුරුන්ද?
1. දෙවනපෑතිස් රජතුමා
2. දුටුගැමුණු රජතුමා
3. වසභ රජතුමා
4. මහසෙන් රජතුමා

12. සෙල්ලිපි අතරින් රචනා කරන ලද මුල් ම සෙල් ලිපි වර්ගය කුමක්ද ?
1. ගිරිලිපි 2. ටැම්ලිපි 3. ලෙන් ලිපි 4. ආසන ලිපි

• පහත වගුවේ තොරතුරු ඇසුරෙන් 13 සහ 14 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| A | දුටුගැමුණු රජතුමා | D | වල්ලිපුරම් රන් සන්නස | G | දිවයින ආස්ථාන වලට බෙදා ඇමතිවරු පත්කිරීම |
| B | වසභ රජතුමා | E | පනාකඩුව තඹ සන්නස | H | චෝලයන්ගෙන් දිවයින මුදාගැනීම |
| C | I විජයබාහු රජතුමා | F | මහා වංශය | I | ප්‍රතිමල්ලවයාට ගරු බුහුමන් දැක්වීම |

13. දුටුගැමුණු රජතුමාට අදාල තොරතුරු ඇතුළත් වරණය වන්නේ,
1. AEI 2. ADG 3. AFI 4. AFH

14. I විජයබාහු රජතුමාට අදාළ තොරතුරු ඇතුළත් වරණය වන්නේ,
1. CDG 2. CDH 3. CFG 4. CEH

15. මෙරට පැරණි අභ්‍යන්තර වෙළඳාම පිළිබඳ අදාල නොවන ප්‍රකාශය තෝරන්න.
1. අභ්‍යන්තර වෙළපොලවල් පැවති බව අනුරාධපුරයේ "තාලසුමන" වෙළඳපොලෙන් අනාවරණය වේ.
2. වෙළඳාමේ නියුක්ත පිරිස් වාණිජ, වාපර යන නම් වලින් හඳුන්වා ඇත.
4. හතරවන උදය රජතුමා විසින් වෙළඳපොල සම්බන්ධ පැන වූ නීති "කළුදිය පොකුණ" සෙල්ලිපියේ දැක්වේ.
4. සංවිධානය වූ වෙළඳ කණ්ඩායම් "පූගය" සහ "නියමස්ථාන යන පදවලින් හඳුන්වා ඇත.

16. ඉඩම් වලින් අයකරන ලද බදු හඳුන්වා ඇත්තේ,
1. දකපති නමිනි 2. බොජකපති නමිනි 3. මතෙරමජිබක නමිනි 4. කැතිඅඹ නමිනි

17. මල් කැටයම් 21 ක් යෙදූ වී ඇටයක ප්‍රමාණයේ රන් තැල්ලක් හමු වූ ස්ථානය කුමක්ද ?
1. අභයගිරිනෙි 2. සීගිරියෙනි 3. ජේතවනයෙනි 4. රුවන්වැලිසෑයෙනි

18. විද්‍යාත්මක දැනුම භාවිතයේ පරිණතිය පෙන්නුම් කරණ ප්‍රධානතම අවස්ථාව වන්නේ,
1. කාලරක්ත මැටි බඳුන් නිපදවීම.
2. ජල කළමනාකරණය සඳහා වැව් ඉදිකිරීම.
3. උස් ගොඩනැගිලි වල ආරක්ෂාව සඳහා වජ්‍ර චුම්බට යෙදීම
4. විධිමත් ලෙස සැලසුම් කරන ලද ගණිතානුකූල ආකෘති භාවිතයෙන් නගර හා උද්‍යාන නිර්මාණය කිරීම.

19. හවජර, තිරීය, මුහුර්ත ආදී මිනුම් ක්‍රම භාවිත වූයේ,
1. කාලය මැනීමට 2. අවකාශය මැනීමට 3. බර මැනීමට 4. දිග මැනීමට

20. ස්ථිතික ජල විද්‍යා මූලධර්මය පිළිබඳව පැරණි ශිල්පීන් සතු ව තිබූ දැනුම පෙන්නුම් කරන නිර්මාණය වූයේ,
1. සමනොළ වැව යකඩ උඳුන්ය
2. දැදිගම ලෝකඩ ඇත් පන්තිය
3. සීගිරියේ ජල මල් ය.
4. වැලිගත්ත ප්‍රදේශයේ ගාවුනකරුය

| **I තීරුව** | **II තීරුව** |
|---|---|
| 1. ඉබ්න් ශහ්රියර් | A-ක්‍රි.ව. 9 වන සියවසේ ශ්‍රීපාදය වන්දනා කිරීම. |
| 2. අල් බලසුරි | B- ශ්‍රී ලංකාවේ පාලකයන් අන්තර්ජාතික වෙළඳාමේ දී නියමිත ක්‍රියාමාර්ග ගත්බව |
| 3. සුලෙයිමාන් | C-සෙරන්ඩිබ් හී කණ්ඩායමක් අරාබියට පැමිණීම |
| 4. ඉබන් බතුතා | D - ගම්පොල යුගයේ දී පැමිණි දේශාටකයා |

21. ඉහත I තීරුව II තීරුව සමඟ නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර වන්නේ,
1. ABCD 2. BDCA 3. CBAD 4. DABC

22. විදේශීය වෙළඳාම පිළිබඳව සඳහන් සෙල් ලිපියක් සොයාගත් පැරණි වරායක් වන්නේ,
1. ගොඩවාය ය 2. මහාතිත්ථ ය 3. ගෝකණ්ණ තිත්ථ ය 4. සූකරතිත්ත ය

23. නීතිය හා සම්බන්ධව පැවති ආයතන පිළිබඳව සෙල් ලිපි වල සඳහන් කරන ලද රජ පෙළපත වන්නේ,
1. මෞර්ය 2. ලම්බකර්ණ 3. කාලිංග 4. මානවම්ම

24. මුදල් හා විනිමය කටයුතු සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය මින් කුමක් ද?
1. මුල් කාලයේ විනිමය කටයුතු සඳහා යොදා ගෙන තිබුණේ මැටියෙන් නිම කළ වෘත්තාකාර කවචයන්ය.
2. මෙරට කාසි භාවිතයට හුරු කරන ලද්දේ උතුරු ඉන්දියාවෙන් පැමිණි වෙළඳුන්ය.
3. කාසි නිපදවීම පිළිබඳව පත්කරන ලද නිලධාරියා වූයේ "කනපෙඩික" ය.
4. මෙරටින් ලැබී ඇති සුලබම විදේශීය කාසි වන්නේ රෝම කාසිය.

25. දූ පුතුන් නැති ජීවිතය කවර සැපක් දැයි භික්ෂූන් ගෙන් ප්‍රශ්න කළේ,
1. විහාර මහ දේවියයි. 2. අශෝකාමාලායි
3. චූල සීවලී රැජිණයි 4. තලතා ලක්‍ෂමියයි

26. පරිසරය ආරක්ෂා කිරීම සඳහා කොණ්ඩවට්ටවාන් සෙල්ලිපිය මගින් නීති පැනවූ පාලකයා කවුරුන් ද?
1. පළමුවන උපතිස්ස 2. හතරවන මිහිඳු 3. තුන්වන උදය 4. පස්වන කාශ්‍යප

27. මූලික ගම්මානවල ජනයා ගොවිතැනට හුරුවීම නිසා සමාජය තුළ සිදු වූ මූලික වෙනස කුමක්ද ?
1. විදේශ වෙළඳාමට යොමු වීම 2. ස්ථිරවාසිතාවය 3. ගම් වැව් ඉදිකිරීම 4. ප්‍රභූ පාලනයට යොමු වීම

28. දෙවන නාගරීකරණය ආරම්භ වන්නේ,
1. පොළොන්නරුවෙනි 2. දඹදෙණියෙනි 3. කුරුණෑගලිනි 4. මහනුවරෙනි

- **ප්‍රශ්න අංක 29 හා 30 යන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත වගුව යොදා ගන්න.**

| | | | | | |
|---|---|---|---|---|---|
| A | තුන්වන විජයබාහු | D | චෙං හෝ ආක්‍රමණය | G | කවි සිළුමිණ |
| B | තුන්වන වික්‍රමබාහු | E | චන්ද්‍රබානු ආක්‍රමණය | H | ගුත්තිල කාව්‍ය |
| C | හයවන පරාක්‍රමබාහු | F | ජෝතිය සිටානන්ගේ කැරැල්ල | I | තිසර සංදේශය |

29. ඉහත දක්වා ඇති තොරතුරු වලින් දඹදෙණි යුගයට අදාළ වන්නේ,
1. ADH 2. BDI 3. CFG 4. AEG

30. කෝට්ටේ යුගය ට අදාළ තොරතුරු ඇතුළත් කාණ්ඩය
1. AFH 2. BDG 3. CFH 4. AEI

31. මහනුවර යුගයේ ඇතුන් ඇල්ලීම අයත් බද්ද සංවිධානය වන්නේ,
1. රදා බද්ද 2. කුරුවේ බද්ද 3. මඩිගෙ බද්ද 4. හැද බද්ද

32. මහනුවර රාජධානියට ස්වභාවික ආරක්‍ෂාව සැපයූ භූ විෂමතා ලක්ෂණයක් නොවන්නේ,
1. හෝර්ටන් තැන්න 2. බලන කපොල්ල 3. මහවැලි ගංගාව 4. හන්තාන කඳුවැටිය

33. පුනරුදය සම්බන්ධයෙන් සාවද්‍ය කියමන මින් කුමක් ද?
1. පුනරුදය තුළින් ඉස්මතු වූයේ ග්‍රීක -රෝම ශිෂ්ටාචාරයයි.
2. පුනරුදයේ කේන්ද්‍රීය රට ඉතාලියයි.
3. මයිකල් ආන්ජිලෝ වඩාත් ප්‍රසිද්ධ වූයේ තාරකා විද්‍යාව සම්බන්ධයෙනි.
4. මධ්‍යම පන්තිය පුනරුදයට විශාල දායකත්වයක් දැක්වූහ.

34. "ලෝරාට සැහැලි කවි ග්‍රන්ථයේ කතුවරයා මින් කවුරුන් ද?
1. අලගියරි ඩාන්ටේ 2. පෙට්රාක්
3. විලියම් ෂේක්ස්පියර් 4. ඉරාස්මස්



Past Papers Wiki

- පහත A සිට D දක්වා ඇති එක් එක් යුගලයෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවය පරීක්ෂා කර බලා ප්‍රශ්න අංක 35-37 දක්වා ප්‍රශ්ණවලට පිළිතුරු සපයන්න.

A
1. දන්තුරේ සටන
2. විමලධර්මසූරිය රජතුමා බලයට පත් වීම

B
1. යුරෝපා ජාතීන් ආසියාවට පැමිණීම
2. වස්කෝ ද ගාමා ඉන්දියාවට පැමිණීම

C
1. ධර්මපාල කුමරුගේ පිළිරුවට ඔටුනු පැළඳවීම
2. සීතාවක රාජසිංහ බලයට පත්වීම

D
1. ලන්දේසි ආගමනය
2. බෙතාවිය පෙරදිග පාලන මධ්‍යස්ථානය වීම

35. පළමුවැන්න තහවුරු වීමට දෙවැන්න හේතු වූ යුගලය වන්නේ,
1. A 2. B 3. C 4. D

36. පළමුවැන්නේ ප්‍රතිඵලයක් ලෙස දෙවැන්න සිදු වූ බව දැක්වෙන යුගලය වන්නේ,
1. A 2. B 3. C 4. D

37. පළමුවැන්න සහ දෙවැන්න අතර කිසිදු සම්බන්ධතාවයක් නොදක්වන යුගලය වන්නේ,
1. A 2. B 3. C 4. D

38. "ත්‍රී සිංහලාධීශ්වර" යන විරුදාවලිය භාවිතා කළ උඩරට පාලකයා වන්නේ,
1. පළමුවන විමලධර්මසූරිය රජු 2. සෙනරත් රජු
3. කීර්ති ශ්‍රී රාජසිංහ රජු 4. දෙවන රාජසිංහ රජු

39. උපරිම ආර්ථික වාසි ලබාගැනීමට ලන්දේසීන් අනුගමනය කළ ප්‍රතිපත්තියක් නොවන්නේ මින් කුමක් ද?
1. පෘතුගීසීන් පන්නා දැමීම සඳහා උඩරට රජතුමාට සහය වීම.
2. කුරුඳු හැර ලාභ ලැබිය හැකි වෙනත් වගාවන් කෙරෙහි යොමුවීම.
3. විදේශ රටවලින් හැකිතාක් සහල් ආනයනය කිරීම.
4. උඩරට පාලකයා සමග ගැටුම් ඇති වූ විට කඩවත් වසා දැමීම.

40. ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා පිටුවහල් කරන ලද්දේ
1. බෙතාවියට ය 2. මදුරාසියට ය 3. වෙල්ලෝරයට ය 4. මැඩගස්කරයට ය



සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

| 10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2024 | 33 S II |
|---|---|---|
| නම: ........................................ | **ඉතිහාසය** | **කාලය පැය දෙකයි** |

**පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
**දෙවන කොටසින් ප්‍රශ්න හතරකටද තුන්වන කොටසින් එක් ප්‍රශ්නයකටද පිළිතුරු සපයන්න.**
**පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.**

(01)(අ) i. දී ඇති ලංකා සිතියමේ පහත ස්ථාන ලකුණු කර නම් කරන්න. (ල. 12)
පොළොන්නරුව, පොතාන, දඹකොළ පටුන, මල්වතු ඔය, කාචරගාම, හුරුළු වැව, මාතොට, නාච්චදූව වැව, ඌරා තොට, සෙංකඩගල, කිරිඳිඔය, කෝට්ටේ

ii. දී ඇති ලෝක සිතියමේ පහත ස්ථාන ලකුණු කර නම් කරන්න. (ල. 06)
ඉතාලිය, පෘතුගාලය, රතු මුහුද, කැලිකට්, ජපානය, සුමාත්‍රා

(ආ) i. A - අරාබි ජාතිකයින් විසින් ලංකාව හඳුන්වා ඇත්තේ කුමන නමකින් ද?
B - දසගම් ඇත්තන් පිළිබඳව තොරතුරු සඳහන් වන සෙල්ලිපිය
C - සබරගමු පළාතේ වැසියන් ගවයින්ගේ ආරක්ෂාවට සිදුකරනු ලබන ශාන්තිකර්මය
D - බෞද්ධ රාජධානි පිළිබඳ විස්තරය නම් දේශාටන වාර්තාව ලියූ චීන හිමියන් (ල. 04)



ii. 1.මෙම නිර්මාණය හඳුනාගෙන නම් කරන්න.
2. ඒවා හමුවූයේ කුමන ගොඩනැගිල්ලක කරන ලද කැනීම් වලින් ද?
3. එම ගොඩනැගිල්ල පිහිටි ඓතිහාසික නගරය කුමක් ද?
4. මේවා කුමන කාර්යයන් සඳහා යොදා ගන්නේ ද? (ල.04)



iii.1. ඡායාරූපයෙන් දැක්වෙන පුද්ගලයා හඳුනාගෙන නම් කරන්න.
2. එතුමා ජීවත් වූයේ කවර රටකද ?
3. එතුමා විසින් රචනා කරන ලද ග්‍රන්ථයක් ලියන්න.
4. මෙතුමා ශ්‍රී ලංකාව හා සම්බන්ධ වන්නේ කවර කරුණක් නිසාද? (ල. 04)

## II කොටස

- **මෙම කොටසින් ප්‍රශ්න 05 ක් තෝරාගෙන පිළිතුරු සපයන්න.**

(02) i. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් මානවයා ජීවත් වූ පරිසර කලාප 03 ක් නම් කරන්න. (ල. 03)
ii. ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජීවන රටාවේ කැපී පෙනෙණ ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 04)
iii. පූර්ව ඓතිහාසික යුගය පරිවර්තන යුගයක් ලෙස සැලකීමට හේතු වූ සාධක දෙකක් නම් කර විස්තර කරන්න.(ල. 05)
iv. මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ස්වරූපය කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ල. 06)

(03) i. පහත සඳහන් පුද්ගලයන් සෙල්ලිපිවල හඳුන්වා ඇති නාමයන් ලියා දක්වන්න.
A - පවුලක ප්‍රධානියා
B - ගමක නායකයා
C - ගම් වැව් පද්ධතියක් පාලනය කළ කාන්තා ප්‍රධානීන් (ල. 03)

ii. පහත කාර්යයන්ට අදාළ නිල නාමයන් වරහනෙන් තෝරා ලියන්න.
A - රජුගේ ඇතුන් සම්බන්ධව කටයුතු කිරීම.

B - නගරයේ පාලනය සම්බන්ධව කටයුතු කිරීම.
C - රාජ්‍ය භාණ්ඩාගාරය සම්බන්ධව කටයුතු කිරීම.
D - ඇමති මණ්ඩලයේ ප්‍රධානියා ලෙස කටයුතු කිරීම.
(ඔතගු , අස අදෙක, නගර ගුතික, හති අදෙක, ශෙනපති, බඩගරික, මහමත, වෙදනා) (ල. 04)

iii. අතීත පාලකයින් තමන්ගෙන් රටවැසියාට ඉටුවිය යුතුයැයි අපේක්ෂා කළ යුතුකම් දෙකක් ලියා විස්තර කරන්න (ල. 05)

iv. වසභ රාජ්‍ය සමයේ වැදගත්කම කරුණු තුනක් යටතේ විස්තර කරන්න. (ල. 06)

(04) i. අනුරාධපුර යුගයේ ඉදිකරන ලද මහ වැව් 3 ක් නම් කරන්න. (ල. 03)

පහත අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු A,B,C,D අනුපිළිවෙලින් ලියා දක්වන්න.

ii. A - විශාල ප්‍රමාණයේ මැටි බඳුන් ළිඳ තුළට බස්සවා බිත්ති ආවරණය කර සෑදූ ළිං
B - විශාල වැව් වලින් ජලය පිතට ගැනීමට සෑදූ ව්‍යූහය
C - සොරොව්ව වෙත ඇදී එන ජලයේ පීඩනය පාලනය කිරීමට සෑදූ අංගය
D - වැව් බැම්ම බාදනය වීම වැළැක්වීමට සෑදූ අංගය (ල. 04)

iii. පුරාණ යකඩ නිස්සාරණය පිළිබඳ සාධක හමුවන ස්ථාන දෙකක් නම් කර එහි ක්‍රියාකාරිත්වය පැහැදිලි කරන්න. (ල. 05)

iv. අතීත පාලකයින් මෙරය වෛද්‍ය සේවා කටයුතු දියුණු කිරීමට ගත් ක්‍රියාමාර්ග තුනක් පැහැදිලි කරන්න. (ල. 06)

(05) i. පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු ABC වශයෙන් අනුපිළිවෙලින් ලියා දක්වන්න.
A - අපරාධකරු අල්ලා දෙනතුරු ගම් වැසියන්ගෙන් අයකල බද්ද
B - සූප ශාස්ත්‍රයේ නිපුන කාන්තාවන් දම්පියා අටුවා ගැටපදයේ හඳුන්වා ඇති ආකාරය
C - කුලියට ලබාගත හැකි දාසයන් හැඳින්වූ නම (ල. 03)

ii. A - පැරණි කාලයේ ආහාර පිසීමට යොදාගත් ක්‍රම දෙකක්
B - අතීතයේ දී ආහාර ඇඹුල් රස ගැන්වීමට යොදාගත් ද්‍රව්‍ය දෙකක් නම් කරන්න.

iii. අතීත රජවරුන් පරිසරය ආරක්ෂා කරගැනීමට ගන්නා ලද ක්ෂේත්‍ර දෙකක් උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 05)

iv. පැරණි සමාජයේ කාන්තාවන්ට ඉතා ගෞරවාන්විත තත්වයක් තිබූ බවට කරුනු 3 ක් ඇසුරින් පෙන්වා දෙන්න. (ල. 06)

(06) i. දෙවන නාගරීකරණයට අයත් මුල්ම රාජධානි 3 පිළිවෙළින් නම් කරන්න. (ල. 03)

ii. පොළොන්නරු රාජධානිය පරිහාණිය හා බිඳවැටීමට බලපෑ හේතු 4 ක් ලියා දක්වන්න. (ල. 04)

iii. දඹදෙණියේ දෙවන පරාක්‍රමබාහු රජුගේ දේශපාලන සේවාවක් හා සාහිත්‍යමය සේවාවාක් කරුණු සහිතව පෙන්වා දෙන්න. (ල. 05)

iv. දෙවන නාගරීකරණ සමයේ පැවති ආර්ථික රටාවේ ස්වභාවය කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ල. 06)

(07) i. මහනුවර රාජධානිය හැඳින්වීමට භාවිතා කළ නම් 03 ක් ලියන්න. (ල. 03)

ii. මහනුවර රාජධානි සමයට අදාලව පහත සඳහන් කාර්යයන්ට අදාළ නිල තනතුරු නාමයන් ABCD යනුවෙන් පිළිවෙලින් ලියා දක්වන්න.
A - රජවාසලට ආහාරපානා සැපයීම
B - කුඩාම පරිපාලන ඒකකය වූ ගමක් භාරව කටයුතු කිරීම
C - රජතුමාගේ අලි ඇතුන් භාරව කටයුතු කිරීම
D - රජතුමාගේ ඇඳුම්, ආභරණ භාරව කටයුතු කිරීම. (ල. 04)

iii. උඩරට සමාජයේ සමාජ සංවිධානයේ ස්වභාවය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ල. 05)

iv. මහනුවර රාජධානියේ පරිපාලන කටයුතු සංවිධානය වී තිබූ ආකාරය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 06)

(08) i. වෙළඳාම පිනිස පෙරදිගට පැමිණි යුරෝපීය ජාතීන් තුනක් නම් කරන්න. (ල. 03)

ii. **පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු ABCD වශයෙන් අනුපිළිවෙලින් දක්වන්න.**
**A** පෘතුගීසීන්ගේ පෙරදිග වෙළඳ මධ්‍යස්ථානය
**B** තුර්කීන් විසින් අල්ලාගත් යුරෝපයේ වෙළඳ නගරය
**C** පෘතුගාලය මුහුනලා ඇති සාගරය
**D** ලංකාවට පැමිනි මුල්ම පෘතුගීසි ජාතිකයා (ල. 04)



සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

iii. සෙසු යුරෝපා ජාතීන් අභිබවා දේශ ගවේශණ කටයුතු වලදී පෘතුගාලය ඉදිරියට ඒමට බලපෑ හේතු දෙකක් ලියා දක්වන්න. (ල. 05)

iv. දේශ ගවේෂණයේ ප්‍රතිඵල තුනක් විස්තර කරන්න. (ල. 06)

(09) **පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු ABCD වශයෙන් අනුපිළිවෙලින් දක්වන්න.**

i. පුනරුදය නිසා ප්‍රසිද්ධියට පත් ඉතාලියේ නගර තුනක් නම් කරන්න. (ල. 03)

ii. A - පෘථිවිය ගෝලාකාර බව සොයා ගැනීම.
B - ගුරුත්වාකර්ෂණ නියමය සොයා ගැනීම
C - රුධිර සංසරණ පද්ධතිය සොයා ගැනීම
D - දුරේක්ෂය නිපදවීම
මේවාට සම්බන්ධ පුද්ගලයින් නම් කරන්න. (ල. 04)

iii. පුනරුද සමයේ ඉතාලියේ බිහි වූ චිත්‍ර හා මූර්ති කලාවේ විශේෂ ලක්ෂණ දෙකක් නිදසුන් දක්වමින් විස්තර කරන්න. (ල. 05)

iv. පුනරුදය ශ්‍රී ලංකාවට බලපෑ ආකාරය කරුනු තුනක් ලියා විස්තර කරන්න. (ල. 06)



Past Papers Wiki

Past Papers Wiki

## ඉතිහාසය - 10 ශ්‍රේණිය

### I පත්‍රය - පිළිතුරු

| | | | |
|---|---|---|---|
| 1 - 1 | 11 - 1 | 21 - 3 | 31 - 2 |
| 2 - 4 | 12 - 3 | 22 - 1 | 32 - 1 |
| 3 - 2 | 13 - 3 | 23 - 4 | 33 - 3 |
| 4 - 4 | 14 - 4 | 24 - 3 | 34 - 2 |
| 5 - 2 | 15 - 3 | 25 - 1 | 35 - 2 (B) |
| 6 - 3 | 16 - 2 | 26 - 4 | 36 - 1 (A) |
| 7 - 4 | 17 - 3 | 27 - 2 | 37 - 3 (C) |
| 8 - 2 | 18 - 2 | 28 - 2 | 38 - 4 |
| 9 - 4 | 19 - 1 | 29 - 4 | 39 - 3 |
| 10 - 3 | 20 - 2 | 30 - 3 | 40 - 3 |

### II කොටස

(01)(අ)i. A - සෙරන්ඩිබ්  B - කළුදිය පොකුණ සෙල්ලිපිය  C - කිරිමඩු ශාන්ති කර්මය  D - පාහියන් හිමි

ii. 1. කතුරු  2. ආලහාන පිරිවෙන
3. පොළොන්නරුව  4. ශල්‍ය කටයුතු සඳහා

iii. 1. ක්ලෝඩියස් ටොලමි  2. ඇලෙක්සැන්ඩ්‍රියාවේ
3. භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය  4. ප්‍රථම වරට ලංකාවේ සිතියමක් ඇඳීම

(02) i. අර්ධශුෂ්ක කලාපය, පහත රට වියලි කලාපය, පහතරට අතරමැදි කලාපය , තෙත් කලාපය ,
කඳුකර වියළි අතරමැදි කලාපය, ශුෂ්ක කලාපය

ii. සතුන් දඩයම් කිරීම / ආහාර සඳහා ද්‍රව්‍ය එකතු කිරීම / කුඩා කණ්ඩායම් ලෙස ජීවත්වීම / විවිධ මෙවලම් භාවිතය / වර්ෂා කාලයේ ගල්ගුහාවලත් වියලි කාලයේ එළිමහනේත් වාසය කිරීම / මළවුන් සම්බන්ධ අභිචාර විධි පැවතීම.

iii. පිළිස්සූ මැටි වළං භාවිතය, ක්‍රමවත් සුසාන චාරිත්‍ර අනුගමනය කිරීම, යකඩ ලෝහ භාවිතය, ස්ථිරවාසිතාව යොමුවීම, කෘෂිකර්මාන්තයට යොමු වීම.

iv. වැවක් කේන්ද්‍ර කරගෙන ගම් බිහිවීම, විවිධ වෘත්තීන් පදනම් කරගෙන ගම් බිහිවීම, කාර්යයන් පදනම් කරගෙන ගම් බිහිවීම, ආරක්ෂාව පදනම් කරගෙන ගම් බිහිවීම.

(03) i. A - ගෘහපති , ගහපති  B - ගමික , ග්‍රාමික  C - පරුමකලු

ii. A - හති අදෙක  B - නගර ගුතික  C - බඩගරික  D - මහමත

iii. රටේ සාමය හා ආරක්ෂාව පවත්වාගැනීම, රටේ ආර්ථිකය දියුණු කිරීම, ජනතාවගේ ආධ්‍යාත්මික සංවර්ධනය ඇති කිරීම.

iv. නව රජ පෙළපතක් ආරම්භ කිරීම, ඒකීය ලංකාවක් ඇති කිරීම, වාරි තාක්‍ෂණය දියුණු කිරීම (මහවැව් ඉදිකිරීම හා උමං ජල මාර්ග)
බදු අය කිරීම, ආගමික දියුණුවට වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම.

(04) i. මින්නේරිය, කවුඩුල්ල, කන්තලේ, ගිරිතලේ, පදවිය, හුරුළු, කලාවැව, නාච්චදූව වැව, යෝධ වැව, මහකනදරා වැව

ii. A - උරා කැට ළිං  B - සොරොව්ව  C - බිසෝකොටුව  D - රළපනාව

iii. ♦ බලංගොඩ සමණල වැව යකඩ නිස්සාරණය උඳුනේ ක්‍රියාකාරීත්වය
♦ සීගිරිය අලකොලවැව දෙහිගහඇලකන්ද යකඩ උඳුනේ ක්‍රියාකාරීත්වය

iv. ♦ 1. රෝහල් ඉදිකිරීම පොළොන්නරුව ආලාහන පරිවෙනේ තොරතුරු, බෙහෙත් ඔරු, සැත් කතුරු, ඔසු උයන් ආදිය
♦ 2. වෛද්‍යවරු පත් කිරීම පණ්ඩුකාභය රජුගේ සිවිකා සාලා, දුටුගැමුණු රජු රෝහල් 18 ක් ඉදිකිරීම.
♦ 3. රෝහල් වලට අවශ්‍ය පහසුකම් ඇපයීම බුද්ධදාස රජුගේ සේවාවන්  ♦ වෛද්‍යවරු සඳහා ගම්බිම් පිදීම
♦ උපසග්ග රෝගනාස, පසවන්තිමසාලා ........  ♦ කැසිකිලි වැසිකිලි වල අපද්‍රව්‍ය කළමනාකරණය

(05) i. A - ගෘහ දණ්ඩ  B - මධුපාවිකා  C - ධනක්කීතදාස

ii. A - බැඳුම, මැල්ලුම, හොද්ද, ආනම, ඇඹුල, නියඹලාව
B - දෙහි, දොඩම්, ගොරකා, නස්නාරං, ගඩාදෙහි, සියඹලා

iii. 1. ගස්කොළන් ආරක්ෂා කිරීම 2. පස ආරක්ෂා කිරීම 3. සතුන් ආරක්ෂා කිරීම
♦ හතරවන මිහිඳු රජුගේ අනුරාධපුර පුවරුලිපිය - උස් ගොඩබිම්වල කැලෑ නොකැපිය යුතු බව.
♦ තුන්වන උදය රජුගේ බුද්ධන්නේහෙල සෙල්ලිපිය - කැලෑවල ගස් කොලන් නොකැපිය යුතු බව.
♦ පස්වන කාශ්‍යප රජුගේ කොණ්ඩවට්ටවාන් ටැම් ලිපිය - ගස්කොලන් කළමනාකරණයේ දී රජයේ නීති රීති අනුගමනය කළ යුතු බව.
♦ කොණ්ඩවට්ටවාන් ටැම් ලිපිය - නිසි කලට සී සෑම නොකරන අයට කලං පහක දඩයක් නියම කිරීම
♦ හතරවන මහින්ද ගේ වෙස්සගිරිය ලිපිය - වැව් වලින් ගොවිතැන් කරන කුඹුරු වල සිහිනැටි වී මිස මුං ඇට වැපිරීම නොකල යුතුබව.
♦ මාඝාත නීතිය, නිශ්ශංකමල්ල රජතුමා විසින් ජළාශ වල ජීවත් වන පක්ෂීන් නොමැරිය යුතු බවට නීති පනවා තිබීම.

iv. • රජිණියන් වීම - වූලසීවලි දේවිය, ලීලාවතී, කල්‍යාණවතී
•පරුමකවරියන් වීම - පරුමකලු සමනා (බ්‍රාහ්මණයාගම සෙල්ලිපියේ)
•රසවාහිනියේ සඳහන් තම ස්වාමියා දුරු රටක වෙළඳාමට ගොස් නැවත පැමිණෙන තෙක් හුදකලාව විසූ කාන්තාව
•රසවාහිනියේ සඳහන් විහාරමහා දේවියගේ මව් ගුණය
•සහස්සවත්ථුපකරණයේ සඳහන් දෙමාපියන්ගේ වගකීම වන්නේ තම දියණිය සූප ශාස්ත්‍රයේ නිපුණ කරවීම බව
•මධුපාචිකා, මිහිරි අත්ගුණය ඇත්ති (අශෝකමාලාගේ පුවත ඇසුරින්)
•තලතා ලක්ෂ්මී භාතියතිස්ස රජ දවස තම දේපල වලින් කොටසක් පූජා කිරීම
•රූපලාවන්‍ය කටයුතු වල නියැළීමට නිදහස තිබීම. (උඩරංචාමඩම නිවසින් හමු වූ ද්‍රව්‍ය)

(06) i. දඹදෙණිය , යාපහුව, කුරුණෑගල, ගම්පොල, කෝට්ටේ
ii. • දුර්වල පාලකයන් බලයට පත්වීම • කාලිංග - පාණ්ඩ්‍ය වංශිකයන් අතර බල අරගලය,
• ආර්ථික පරිහාණිය •කාලිංග මාඝගේ ආක්‍රමණය
iii. දේශපාලන - චන්ද්‍රබානුගේ පළමු ආක්‍රමණය ජය ගැනීම, කාලිංග මාඝ පරාජය කිරීම, චන්ද්‍රබානුගේ දෙවන ආක්‍රමණය ජයගැනීම.
සාහිත්‍යමය - කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත" යන උපාධි නාමය ලැබීම. කව්සිළුමිණ හා විශුද්ධි මාර්ග සන්නස රජතුමා විසින්ම ලිවීම. සාහිත්‍යකරණයේ යෙදුණ අයට අනුග්‍රහ දැක්වීම. පොතපත ලියවීම ( පිටුව 104 අග සහ 105 මුල ටික)
iv. •කෘෂිකාර්මික කටයුතු සඳහා අහස්දිය යොදා ගැනීම, හෙල්මළු වගාව සිදුකිරීම, ජලය හිඟ ප්‍රදේශවල හේන් ගොවිතැන කිරීම, ගෙවතු වගාවන් කිරීම,
•වගාවේ අතිරික්තය වෙළඳාමට යොදා ගැනීම (කුරුඳු , ගම්මිරිස්, එනසාල්, සාදික්කා, පුවක්)
•වෙළඳාම් කල විදේශ රටවල් (ඉන්දියාව, අරාබිය, චීනය, පර්සියාව, ඊජිප්තුව)
•අභ්‍යන්තර වෙළඳාම සම්බන්ධ කඩවීදි තිබූ බව - කුරුණෑගල විස්තරය නම් පුස්කොළ පොතේ සඳහන් වීම.
•චීනයෙන් පිඟන් භාණ්ඩ ආනයනය කළ බව - දෑදිගම සාක්ෂියෙන් තොරතුරු ලැබීම.
•වෙරළබඩ නැව් තොටු ආශ්‍රිතව සරුසාර වෙළඳාමක් තිබූ බව ඉබන් බතුතාගේ විස්තරයේ සඳහන් වීම.

(07) i. සෙංකඩගල නුවර, උඩරට රාජධානිය, කන්දෙ නුවර, කන්ද උඩපස් රට, කන්ද උඩරට රාජධානිය, කටුපුලු නුවර
ii. A - බත්වඩන නිලමේ B - විදානේ C - ගජනායක නිලමේ D - සළුවඩන නිලමේ
iii. •රටේ සියලුම ඉඩම් අයිතිය රජු සතුවීම.
•ඉඩම් අයිතිය හා භුක්තිය පදනම්ව කොටස්වලට බෙදීයාම, ග්‍රාමීය සමාජයක වීම.
•ග්‍රාමීය සමාජයක් වීම. •රාජකාරි සේවා ක්‍රමය පැවතීම
•සමාජ සම්බන්ධතා කුල ක්‍රමය මත පදනම් වීම. •මූලික විවාහ ක්‍රම 3 ක් පැවතීම.
•පවුල ප්‍රධාන සමාජ ඒකකය වීම. •ගුණ ගරුක බව සමාජයේ දක්නට ලැබීම.
•අත්තම් ක්‍රමයට සියලු කටයුතු කරගැනීම
iv. •පරිපාලන සංවිධානයේ ප්‍රධානියා රජතුමාය.
•රටේ සාමය හා ආරක්ෂාව සැලසීම රජුගේ ප්‍රධාන කාර්යයි.
•පාලන කටයුතු වලදී රජුට සහය වීමට අදිකාරම්වරු දෙදෙනෙක් සිටියහ.
•මහ අදිකාරම් හා දෙවන අදිකාරම් යටතේ ප්‍රදේශ පරිපාලනය වීම.
•රාජ්‍ය කටයුතු රාජ සභාව මගින් මෙහෙයවීම. •අදිකාරම්වරු, දිසාවේවරු, මහලේකම්, බද්දේලේකම්ලා
•මහවාසල සේවය - රජුගේ සෘජු අධීක්ෂණය යටතේ සිදුවිය. • රටවසම යටතේ පාලනය - රට හා දිසාව ලෙස බෙදා පාලනය
• බද්දේ සංවිධාන - දිසාව තුල සිටි ශිල්පීන් කාර්යයන් අනුව සංවිධානය වීම.
• විහාර දේවාල පාලනය
•අධිකරණ කටයුතු - ඉහළම බලය රජු සතුය. ඒ ඒ නිලධාරීන්ට තනතුරු අනුව අධිකරණ බලතල හිමිවිය. දඬුවම් ක්‍රම පැවතීම.

(08) i පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රිසි, ප්‍රංශ
ii. A ගෝව B. කොන්ස්තන්ති නෝපලය C. අත්ලන්තික් සාගරය D. ලොරෙන්සෝද අල්මේදා
iii. පාලක අනුග්‍රහය ලැබීම( නාවික හෙන්රිගෙන් ලැබුනු අනුග්‍රහය)
අත්ලන්තික් සාගරයට මුහුනලා තිබීම
සාම්ප්‍රදායිකව මුහුදු ගමන්වල යෙදීමෙන් ලැබූ අත්දැකීම්
iv. නව රටවල් සොයා ගැනීම, යටත් විජිත පිහිටුවා ගැනීම, නව වෙළඳ මාර්ග සොයා ගැනීම, යුරෝපා චින්තනය ලොව පුරා පැතිර යාම

(09) i. ප්ලෝරන්ස්, වැනීසිය, ජිනෝවා, රෝමය
ii. A- නිකලස් කොපර්නිකස් B - සර් අයිසෙක් නිවුටන් C-විලියම් හාවේ D-ගැලීලියෝ ගැලීලි
iii. •ආගමික මුහුණුවරකින් වෙනස් වී ලෞකික මුහුණුවරක් ගැනීම. •නිරුවත් හා අඩ නිරුවත් කලාකෘති බිහිවීම.
•කිරිගරුඬ ප්‍රතිමා නෙලීම • කලා ශිල්පීන් හා කලාකෘති නම් කර තිබීම.
iv. පාර්ලිමේන්තු පාලන ක්‍රමය, රෝම ලන්දේසි නීතිය , නව නිලධාරි පන්තියක් බිහි වීම, ව්‍යාපාරික වතු වගාව, මැකඩම් ක්‍රමය


සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

# 10 ශ්‍රේණිය කෙටි සටහන් පොත් සංශෝධිත නව විෂය නිර්දේශයේ පාඩමෙන් පාඩමට




Rs : 300




Rs : 300




Rs : 300




Rs : 300




Rs : 150




Rs : 150




Rs : 150




Rs : 150




Rs : 150




Rs : 200




Rs : 300




Rs : 350




Rs : 300




Rs : 300




Rs : 150




Rs : 200




Rs : 150




Rs : 300




Rs : 300




Rs : 300

මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE



පොත් 3 ක් ගත්තොත්,
1 ක් නොමිලේ.
25% දක්වා වට්ටම් හිමිකරගන්න.
හොඳම පොත් අඩුම මිලට
අපෙන් විතරමයි...
දැන්ම lol.lk වෙත පිවිසෙන්න
Atlas
Richard
RATHNA EXERCISE BOOKS
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
LOL.LK
LOL STORE (PVT) LTD
COD
CASH ON DELIVERY
037 20 60 110
071 77 74 440